# 6 සිරි සදහම් ගුණ මනරම්

**සපුරා දස පෙරුම් - පළ කළ බුදුව මනරම්**
**හරවා බව බිරම් - වදිම් අදරින් අනගි සදහම්**

සීයා එදින අමරලාගේ නිවසට පැමිණියේ ඔවුන්ගේ සුවදුක් විමසා බැලීම සඳහා ය. අමරත් ඔහුගේ මව හා පියාත් දෙදණ බිම තබා වැඳ ආදර ගෞරවයෙන් යුතු ව ඔහු පිළිගත්හ. තුනුරුවන් සරණ පතමින් සීයා ඔවුන්ට ආශිර්වාද කළේ ය.

"අද හොඳ දවසක්, සීයා ගිය මාසේ අපේ ගෙදර එද්දී මම හිටියේ හයේ පන්තියේ. එදත් අද වගේ ම 'තුනුරුවන් සරණයි' කියා සීයා මට බුදුගුණ හා බුදු සරණ ගැන කියා දුන්නා. ඊළඟ දවසක දහම් ගුණ හා දහම් සරණ ගැන මට කියා දෙන බවට සීයා පොරොන්දු වුණා. දැන් මම ඉන්නේ හතේ පන්තියේ. සීයා අද මට දහම් ගුණ කියා දෙනවා නේ ද?"

"ඔව්, මගේ පුතා කොච්චර හොඳ ද, අද මම පුතාට දහම් ගුණ කියා දෙන්නම්."

"පුතේ, තාත්තා තවමත් උදේට හවසට තුනුරුවන් වඳිනවා නේ ද? පුතාත්, අම්මාත් එයට එකතු වෙනවානේ?"

"ඔව් සීයේ."

"හොඳයි, පුතාට මතක ද ඒ වෙලාවේ ''**ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ...**'' යනුවෙන් පාඨයක් කියන බව."

"ඔව් සීයේ, මට හොඳට මතකයි"

"පුතේ ධර්ම රත්නයේ ගුණ ගැන කියැවෙන්නේ ඒ ස්වාක්ඛාතෝ පාඨයෙන් තමයි. පුතා ඒ පාඨය කියන්න බලන්න."

**"ස්වක්ඛාතෝ භගවතා ධම්මෝ සන්දිට්ඨිකෝ අකාලිකෝ ඒහි පස්සිකෝ ඕපනයිකෝ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී ති"**

"හොඳ පුතා, ඉතා ම නිවැරැදි ව කිව්වා. ඉතින් පුතේ මේ පාඨයෙන් ධර්ම රත්නයේ ගුණ කීයක් කියවෙනවා ද කියලා දන්නවා ද?"



6.1 රූපය

"නැහැ සීයේ."

"ගුණ හයක් ගැන කියවෙනවා පුතේ, ඒ ගුණ හය මොනව ද කියලා දැන් මම පැහැදිලි කරලා දෙන්නම්."

"සීයේ අර මම හයේ දී ඉගෙන ගත්ත බුදුගුණ ගැන කියැවෙන කවි වගේ ධර්ම රත්නයේ ගුණ ගැන කියවෙන කවිත් තියෙනවා ද?"

"ඔව් පුතේ, මම ඔයාට ඒ ගුණ හය ගැන ලියවුන කවියි තේරුමයි කියල දෙන්නම්."

මුලමැද හා අගද
යහපත් ලෙසට මුනි සඳ
දෙසුයෙන් දහම් කඳ
**ස්වාක්ඛාත** ය කියා නම් ලද

බුදුරජාණන් වහන්සේගේ ධර්මය මුල-මැද-අග මැනවින් දේශනා කර ඇති නිසා **ස්වාක්ඛාත** නමින් හඳුන්වනු ලබනවා.

මෙම අත්බවේ දිම
පිළිපදී නම් සදහම
ලැබෙනුයෙන් පල හැම
යෙදේ **සන්දිට්ඨික** ය යන නම

තමාගේ සිතෙහි ඇති රාග දෝස-මෝහ-යන කෙලෙසුන් නැති කර මේ ජීවිතයේ දී තමා විසින් ම දැක සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත් වීමට හේතු වන නිසා ශ්‍රී සද්ධර්මය **සන්දිට්ඨික** නමින් හඳුන්වනවා.

කාලයක් නැතිවම
මගපල ලැබෙයි හැමදම
එම අරුත ඇතිවම
**අකාලික** නම දරයි සදහම

කිසියම් නිශ්චිත කාලයකට සීමා නො වීම නිසාත් සෝවාන් ආදී මාර්ගවලට පත් මොහොතේ ම කල් නො යවා ඵල අවබෝධය ලබාදෙන නිසාත් **අකාලික** ලෙසින් හඳුන්වනවා.

ඇවිදින් බලනු මැන
අඳ බැතියකින් නොම ගෙන
ඇරයුම් ඇති බැවින
**ඒහිපස්සික** කියා පැවැසින

විශ්වාසයෙන් පිළිගන්න යැයි නො කියා එන්න බලන්න යනුවෙන් ආරාධනා කැරෙන ස්වරූපයක් මෙම ධර්මයෙහි පවතින හෙයින් **ඒහිපස්සික** නම් වේ.

| | |
|---|---|
| තම සිත් සතන් | තුළ |
| උපදවා ගතයුතු | බල |
| ඇති බැවින් සැම | කල |
| **ඕපනයික** ය දහම | නිකසල |

තම සිතට අරමුණක් කර ගැනීමට ඉතා ම සුදුසු වන නිසාත් සියලු කටයුතුවලට පෙර ධර්මය සිතෙහි පිහිටුවා ගත යුතු නිසාත් **ඕපනයික** නමින් හඳුන්වනවා.

| | |
|---|---|
| තම තම නැණ | මඟින් |
| දහම දත යුතු | මැනවින් |
| **පච්චත්ත** | වශයෙන් |
| **වේදිතබ්බ** ය කියති | එබැවින් |

නුවණැතියන් විසින් තම තමා ම වෙන වෙන ම දැන ගත යුතු දහමක් නිසාත් අන්‍යයන්ගේ කීමට නො ව තමා ම අත් විඳිය යුතු දහමක් නිසාත් **පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහි** ලෙසින් හඳුන්වා තිබෙනවා.

"ඔන්න ඔය විධියට තමයි පුතේ ධර්ම රත්නයේ ගුණ විස්තර කරලා තියෙන්නේ. උන් වහන්සේ තිලෝගුරු වුවත් තමා අවබෝධ කරගත් මේ ධර්මය ගුරු තනතුරෙහි තබා ගත්තා."

බුදු හාමුදුරුවෝ පිරිනිවන් පාන විටත් අනෙක් හාමුදුරුවන්ට දේශනා කළේ "මාගේ ඇවෑමෙන් ධර්මය හා විනය ගුරුවරයා වශයෙන් සලකන්න" කියායි.

"පුතේ මේ ශ්‍රේෂ්ඨ වූ ධර්මය නිතර නිතර සිහිකරමින් දහම් සරණ යෑමෙන් අපේ මෙලොව ජීවිතයත් පරලොව ජීවිතයත් ජය ගන්න පුලුවන්. ඒ නිසා නිවන් දක්නා ජාති දක්වා ම අපි මේ ශ්‍රේෂ්ඨ වූ ධර්ම රත්නය සරණ යමු."



6.2 රූපය

**"සීයේ, මට ධර්ම රත්නයේ ගුණ කියා දුන්නාට සීයාට දීර්ඝායුෂ ලැබේවා".**

**"ධම්මරතනං යාව නිබ්බානං සරණං ගච්ඡාමි"**

**(නිර්වාණයට පැමිණෙන තුරු දහම් සරණ යමි.)**

### සාරාංශය

- තිලෝගුරු වුව ද බුදුරජාණන් වහන්සේ තමා ම අවබෝධ කරගත් ධර්මය ගුරු තනතුරෙහි තබාගත් සේක.
- අපි "ස්වාක්ඛාතෝ" පාඨයෙන් එම ධර්මයේ ගුණ සිහිපත් කරමු.
- "ස්වාක්ඛාතෝ" පාඨයෙන් ධර්ම රත්නයේ ගුණ හයක් විස්තර වෙයි.
- එම උතුම් ගුණ මැනවින් හැඳිනගෙන දහම් සරණ යමු.

*පුහුණුවට*

ඇම පමණින් පැවසූ මුනි දන තතු
මෙම හැම දෙන බලවයි දැක්විය යුතු
තම තම නැණ පමණින් දැන ගත යුතු
මම නමදිම් සදහම් පහදා සිතු

ලෝවැඩ සඟරාව

## ක්‍රියාකාරකම

1. ධර්ම රත්නයේ ගුණ හය නම් කරන්න.
2. ඔබ කැමති එක් ගුණයක් විස්තර කරන්න.
3. ධර්ම රත්නයේ ගුණ හැඳිනගෙන ක්‍රියා කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න.
4. ස්වාක්ඛාතෝ පාඨය නිවැරදි ව ශබ්ද නගා කියවන්න.

## පැවරුම

ධර්ම රත්නයේ ගුණ විස්තර කෙරෙන පොත් පිංචක් නිර්මාණය කරන්න.